# දැන්වීමයි

# හජ් වන්දනාකරුවන් ලියාපදිංචි කිරීම - 2026

## හජ් සහ උම්රා කමිටුව

## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා හජ් සහ උම්රා කමිටුව 2026 වර්ෂයේ හජ් වන්දනාමානය කිරීමට අපේක්ෂා කරන බැතිමතුන්ගෙන් අයදුම්පත් කැඳවයි.

මේ සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ 2025.07.03 දින සිට https://muslimaffairs.info/hajjapplications_26/create ලියාපදිංචි විය හැකිය. තවද පෙර වර්ෂවලදී හජ් වන්දනාව සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සියලුම ලියාපදිංචි අවලංගු වන බවද මෙයින් දන්වා සිටිමු.

2026 වර්ෂය සඳහා ලියාපදිංචි වන බැතිමතුන් තම හජ් වන්දනාව තහවුරු කිරීම සඳහා ආපසු නොගෙවන මුදල වශයෙන් රු.5000.00 ක තැන්පතු මුදලක් ලංකා බැංකුව හයිඩ්පාර්ක් ශාඛාවේ අංක 232593 දරන මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු හජ් ගිණුමට **(MRCA Hajj, Account no. 2327593, Bank of Ceylon, Hyde Park Branch)** තැන්පත් කර එහි ලදුපත මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඔබගේ හජ් වන්දනාව තහවුරු කරනමෙන් ඉල්ලා සිටිමු.

2025 වර්ෂයේ හජ් වන්දනාව තහවුරු කිරීම සඳහා ආපසු නොගෙවන මුදල වශයෙන් රු.5000.00 ක තැන්පතු මුදලක් ගෙවා හජ් වන්දනාවේ **සහභාගිවීමට නොහැකි වූ බැතිමතුන්,** 2026 වර්ෂයේ හජ් වන්දනාව සඳහා වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ (Online https://muslimaffairs.info/hajjapplications_26/create ) නැවත ලියාපදිංචි විය යුතු නමුත් ආපසු නොගෙවන මුදලක් වශයෙන් රු.5000.00 ක තැන්පතු මුදල නැවත ගෙවීමක් සිදුකිරීමට අවශ්‍ය නොවේ. 2026 වර්ෂයේ හජ් වන්දනාව සඳහා මෙම අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලෙබේ.

වැඩි විස්තර මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ හජ් අංශයේ දුරකථන අංක 0112667901 හා සම්බන්ධ වී ලබාගත හැක.

එම්.එස්.එම්.නවාස්
**අධ්‍යක්ෂ,**
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

රියාස් මිහුලාර්
**සභාපති**
ශ්‍රී ලංකා හජ් සහ උම්රා කමිටුව


අංක 180, ටී.බී.ජායා මාවත, කොළඹ 10

දුරකථන අංක : 0112667909 / 0112667901

වෙබ් අඩවිය : www.muslimaffairs.gov.lk